
# නපුරු කාල් හොඳ වූ හැටි



## ගයන්සා වර්ණකුලසූරිය

# නපුරු කාල් හොඳ වු හැටි

ගයන්සා වර්ණකුලසූරිය

2025.02.08

978-624-208-816-7

# පිදුම

මෙම පොත මාගේ

දෙමාපියන්ටත්, මට ඥාන

නුවණ ලබා දෙන

ගුරුවරුන්ටත් ආදරයෙන්,

ගෞරවයෙන් පුද කරමි!

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලිය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිම්පාණන් වහන්සේට උපහාර පිණිස අතිත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දිමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,


ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

ඔන්න එකමත් එක කාලෙක ලස්සන කුරුලු පවුලක් ජිවත් වුණා. මෙයාලා ජිවත් වුනේ හරිම ලස්සන කැලෑවක. මේ කැලෑවේ ඉන්න සතුන් හරිම සමගියෙන් එකිනෙකාට උදව් කරමින් සතුටින් ජිවත් වුණා.



ඒත් මේ කැලෑවේ සතුට ගැව්ලාවත් නැති කෙනෙකුත් ජිවත් වුණා. මෙයා තමා මේ කැලෑවේ හිටපු නරකම නරක සතා. මෙයාගේ නම තමා කාල්. කාල් නපුරුම නපුරු නාගයෙක්. මෙයා කිසි කෙනෙකුට උදව් කරන්නෙත් නැහැ.



එත් මෙයාගේ අම්මයි තාත්තයි නම් එහෙම නැහැ. හරිම හොඳයි. කාල්ගේ අම්මයි තාත්තයි නම් අනෙක් අයට උදව් කරමින් කැලෑවේ සතුන් සමඟ සමගියෙන් සතුටින් ජිවත් උණා. එත් කාල් නම් මේ දේවල්වලට කැමති නැහැ. හැම වෙලාවේම කාවහරි රිද්දලා සතුටක් ගන්නවා. කරන්නෙම නපුරු නරක වැඩ. අම්මයි තාත්තයි කියන කිසි දෙයක්වත් කාල් ඇහුව්වේ නැහැ.

එක දවසක් මේ කැලෑවේ හිටිය කුරුලු අම්මටයි තාත්තටයි කුරුලු පැටව් ලැබෙන්න හිටියා. මේ කුරුලු බිත්තර ටික දාලා දවසක් කුරුලු අම්මයි තාත්තයි කෑම හොයන්න ගියා.



මේ කුරුලු බිත්තර ගැන කාල්ටත් ආරංචි වුණා. කාල් කුරුලු අම්මයි තාත්තයි කෑම හොයන්න ගිය වේලාවේ මේ බිත්තර කනවා කියලා ගහට නගින කොටම කාල්ගේ අම්මයි තාත්තයි එතනට ආවා. කාල්ගේ අම්මයි තාත්තයි කාල්ට කෑගහලා කිව්වා." පුතේ ඕක කරන්න එපා." කියලා. එත් කාල් මේ අම්මයි තාත්තයි කියන කිසිම දෙයක් කනතටවත් ගත්තේ නැහැ.

ටික වේලාවකින් කුරුලු අම්මයි තාත්තයි එතනට ආවා. කුරුලු අම්මට කාල්ව දැක්ක ගමන් කෑගසුණා. කුරුලු අම්මගේ කෑගැහිල්ලට කැලෑවේ සත්තු ඔක්කෝම එතනට ආවා. කාල් හොඳටම බය වුණා.



මේ කැලෑවේ හිටපු එක් සතෙක් කිව්වා "මේ වගේ වැඩ කරන අයව මරලා දාන්න තමා ඕනේ." කියලා. මේ කාල්ව මරලා දාන වැඩේට කැලෑවේ හිටපු සත්තු ඔක්කෝම කැමති වුනා. එත් කුරුලු අම්මනම් මේ වැඩේට කැමති උනේ නැහැ. කුරුලු අම්මාට කාල්ගේ අම්මාගෙයි තාත්තාගෙයි මුහුණු දැකලා දුක හිතිලා කුරුලු අම්මා අනෙක් හැමෝටම කාල්ව මරන්න එපා කියලා කිව්වා. මේ පුංචි කාල් හොඳටම බය වෙලා අඩ අඩා වේව්ලන්නත් පටන් අරගෙන කුරුලු අම්මා කාල්ගේ මුහුණ දැකලා ගොඩක් දුකට පත් වුණා.

කාල් හෙමීහිට කුරුලු අම්මා ගාවට ගිහිල්ලා "මට සමාවෙන්න" කියලා හයියෙන් අඩන්න පටන් ගත්තා. කුරුලු අම්මාට හොඳටම දුක හිතුනා.



ඊට පස්සේ කුරුළු අම්මා කාල්ට අවවාද කළා. නපුරු වැඩ නරක වැඩ එහෙම කරන්න හොඳ නැහැ කියලා අනෙක් අයට උදව් කලහොත් ආදරයෙන් කරුණාවෙන් සැලකුවොහොත් තමා අපටත් ආදරය කරුණාව ලැබෙන්නේ කියා කුරුළු අම්මා කාල්ට කියා දුන්නා. කාල් හොඳ ගතිගුණ තියන හොඳ නාගයෙක් බවට පත් වුණා. දැන් හමෝම කාල්ට ආදරෙයි.

ඊට පස්සේ කැලේ ඉන්න සත්තු හැමෝම ආදරයෙන් සමගියෙන් සතුටින් ජීවත් වුණා.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරිමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනිම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරිමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධිකාරක,
සෙනෙවිරත්න මහලේකම්